# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 50 — 1973 මාර්තු 09 වැනි සිකුරාද — 1973.03.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබැර්තු ... ... ... | 299 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 320 |


## තනතුරු – ඇබැර්තු

**සැලකිය යුතුයි.**—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 2 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතන පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 3 දරන කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන (ඉවත් කිරීමේ) පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා ප්‍රවෘත්ති පත් මණ්ඩල පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 6 දරන තැපැල් කාර්යාල (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත 1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ, (ii) ධීවර (සංශෝධන) පනතත් කෙටුම්පත සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත් කෙටුම්පත 1973 මාර්තු මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී. (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් පළවේ.

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට නම් පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්ණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. ***රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.***—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. සී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

8. **සේවා කොන්දේසි :** තෝරාගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි ඨානාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි.

1. පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

2. දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

3. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

4. මණ්ඩලීය අර්පසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 6 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 9 කි.

5 ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

9. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කල ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන වෙත 1973. 03. 26 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ,
අංක 200 වෙනි ස්ථානයේදී ය.
1973. 02. 21.

**ලංකා ගමනාගමන මණ්ඩලය**

(ඉල්ලුම් පත්‍ර පෝර්මය)

1. ඉල්ලන තනතුර :————.

2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.

3. ලියුම් ලැබෙන පිළිවෙල :————..

4. උපන් දිනය (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.) :————.

5. 1973. 03. 26 දිනට වයස :—.
   අවුරුදු :———, මාස :———, දවස් :———.

6. ලාංකිකයෙකුවූයේ පෙළපතින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග :————.

7. විවාහකද, අවිවාහකද යන බව (විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.) :————.

8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය (ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න.) :————.

9. **උසස් අධ්‍යයනය :** ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාගය, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න. (සහතික පත්‍ර වල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න.) : ————.

10. **කාර්මික/වෘත්තීය සුදුසුකම් :** ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත් වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න. (සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.) :————.

11. පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (එනම්, දුරු පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.) :————.

12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (දරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දියත් සහිතව සඳහන් කරන්න.) :————.

13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් (මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂෙප විස්තරයක් ලියන්න.) :————.

14. සිංහල භාෂාවෙන් සමත්වී ඇති ඉහළම ප්‍රමාණය :————.

15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේ ද ? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක් ද? :————.

16. සෙසු විස්තර :————.

17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙක් වූයේ දැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

18. ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :————.
    1. ————.
    2. :————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරාගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

3-344—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ධීවර සංස්ථාව**

ඇබෑර්තුව

සංස්ථා සේවයේ 1 වන ශ්‍රේණියේ ප්‍රධාන ගණකාධිකාරි තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**වැටුප් ක්‍රමය.—මසකට රු. 1,500—50 × 10—රු. 2000 (සියල්ල අඩංගු)**

**සුදුසුකම්.**—ගණක විද්‍යාව පිළිබඳව සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා සිටිය යුතුය. ගිණුම් වැඩ පිළිබඳව සුදුසු පළපුරුද්දක් ලබා ඇති අයට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

**සටහන.**—මෙය ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරක් වන අතර, මේ සඳහා තෝරාගනු ලබන්නා විසින් මෙම සංස්ථාවේ මුදල් පරිපාලනය හා ගිණුම් කටයුතු පිළිබඳව සම්පූර්ණ වගකීම භාරගැනීම අවශ්‍ය වනු ඇත.

රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම පිණිසද, දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවලට ද තෝරාගනු ලබන අපේක්ෂකයන් අනුකූල විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ පියවරක් මත තැබීම ගැන සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවාවේ හෝ මංඩල/සංස්ථාවල නියුතු නිලධාරීන් විසින් එවන අයදුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු හා මණ්ඩල/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

අයදුම්කරුවන් විසින් ඔවුනගේ වයස, අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් හා පළපුරුද්ද ඇතුළුව සියළුම විස්තර සඳහන් කොට සහතිකවල පිටපත් ද අයදුම්පත් වලට අමුණා 1973.03.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

සේවක මණ්ඩල කළමනාකාර.

රොක්හවුස් පටුමග,
මෝදර,
කොළඹ 15.

3-237—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

## නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය

### ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර

නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයන්ට පෙර, කොළඹ 1, ට්‍රාන්ස් වර්ක්ස් මන්දිරයේ, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්—1973 මාර්තු මස 30 වැනි ද

(බී) විදේශීය ඉල්ලුම් පත්—1973 අප්‍රේල් මස 9 වැනි ද

**සටහන :**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුලත දී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තුන් අවුරුදු ආධුනික කාලය කට යටත්ව පත්වීම කරනු ලැබේ. අයදුම්කරුවෙකු තෝරාගනු ලැබුව හොත් ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත්, ඔහු අළුත් තනතුරෙහිද විශ්‍රම වැටුප් අයිති වාසිකම් ලැබීමට තවදුරටත් හිමිකම් ලබනු ඇත. පළමුකොට ඔහු නියමිත කාල සීමාවකට වැඩ බැලීමේ තනතුරකට පත් කරනු ලබන අතර, එම තනතුර දැරීමට ඔහු නුසුදුසු යයි සලකනු ලැබුවහොත්, එම කාලය තුල දී ඕනෑම අවස්ථාවක ඔහු මුල් තනතුරට ආපසු පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—රු. 18,840 න් පටන් ගෙන රු. 600 වාර්ෂික වැඩිවීම් 2 කින් රු. 20,040 දක්වා නගින වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) 1973 මාර්තු 30 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ 45 ට නොවැඩි බව. (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත වූවනට මෙම වයස් සීමාවන් බල නොපානු ඇත.)

(බී) පිළිගත් විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධිය සමඟ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහ සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් ක්‍රම සම්පාදනය සහ වැඩ සටහන් පිළියෙල කිරීම ඇතුළුව ඉංජිනේරුවරයෙකු වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන :** සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් වැඩවල නිරත වී සිටි අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**හෝ**

පහත සඳහන් පිළිගත් ගිණුම් ආයතනයන් ගෙන් එකක සාමාජිකයෙකු වියයුතු අතර, වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසුව යටත් පිරිසෙයින් අවුරුදු 4 ක පළපුරුද්දක් සහිතව ගණකාධිකාරිවරයකු වශයෙන් අවුරුදු 12 ක පළපුරුද්දක් තිබිය යුතුය.

(i) ලන්ඩන්හි පිරිවැය හා කළමනාකාරීත්ව ගණකාධිකාරීන්ගේ ආයතනය.

(ii) ලන්ඩන්හි වරලත් ගණකාධිකාරීගේ ආයතනය.

(iii) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය.

**සටහන :** රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්ව/ක්‍රම සම්පාදනය සහ පාලන ක්‍රම යනාදිය පිළිබඳව පිළිගත් පුහුණුවක් ලබා සිටින්නාවූද, ආර්ථික හා සංඛ්‍යාලේඛන අධ්‍යයන කටයුතු සංවිධානය හා පරිපාලනය පිළිබඳ රාජකාරි ඉටුකිරීමෙහිලා සුදුසු වන විශේෂ පළපුරුද්දක් ඇත්තාවූ ද අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ I වැනි පන්තියේ හෝ II වැනි පන්තියේ ගෞරව උපාධියක් සහ I වැනි උපාධිය ලබාගැනීමෙන් පසු යටත් පිරිසෙයින් 10 අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන :** අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ලබා ගත් අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඩී) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන :** (1) කිසිම ලියවිල්ලක් අයදුම්පතට ඇමිණිය යුතු නොවේ.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත් එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම්ට කෙලින්ම දන්විය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලියකියවිලි නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් නමට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකු ගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුලත එම අයදුම්පත් ලැබුණ බව දන්වනු ලැබේ. එසේ දන්වීමක් නොලැබුණු විට ඒ බව වහාම නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

ඒ. එම්. එන්. අමරකෝන්,
ලේකම්, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ 1,
" ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය ",
නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ දිය.

### ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් ෆෝර්මය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන්දිනය හා ස්ථානය :————.
   (1973 මාර්තු 30 දිනට වයස :——. අවු :——. මාස :——. දින :——.)
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසැලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
9. දැනට කරන රක්ෂාව :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නාම :————.
11. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් හෝ මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට මා බැඳී ඇති බවද මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–408/1—73..03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය**

සහකාර වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර

නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ සහකාර වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයන්ට පෙර, කොළඹ 1, චිරාන් ස්වර්ක්ස් මන්දිරයේ, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1973 මාර්තු මස 30 වැනිදා.
(බී) විදේශීය ඉල්ලුම්පත්—1973 අප්‍රේල් මස 9 වැනිදා.

**සටහන් :**

(I) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගතයුතුය.

(II) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුලතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(III) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත්වීම කරනු ලැබේ. අයදුම්කරුවකු තෝරාගනු ලැබුව හොත් ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත්, ඔහු අළුත් තනතුරෙහිද විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ලැබීමට තවදුරටත් හිමිකම් ලබනු ඇත. පළමුකොට ඔහු නියමිත කාල සීමාවකට වැඩ බැලීමේ තනතුරකට පත් කරනු ලබන අතර, එම තනතුර දැරීමට ඔහු නුසුදුසු යයි සලකනු ලැබුවහොත්, එම කාලය තුලදී ඕනෑම අවස්ථාවක ඔහු මුල් තනතුරට ආපසු පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—රු. 10,080 න් පටන් ගෙන රු. 480 වාර්ෂික වැඩිවීම් 13 කින් රු. 16,320 දක්වා නගින වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(ඒ) 1973 මාර්තු 30 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු සහ 45 ට නොවැඩි බව. (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත වූවනට මෙම වයස් සීමාවන් බල නොපානු ඇත.)

(බී) ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණිතය, සංඛ්‍යා ලේඛන, භෞතික විද්‍යාව හෝ සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක 1 වැනි පන්තියේ හෝ 11 වැනි පන්තියේ ගෞරව උපාධියක් ලබා තිබෙන බව.

**සටහන :** ආර්ථික හා සංඛ්‍යා ලේඛන අධ්‍යාපනයන් සංවිධානය, පරිපාලනය සහ මෙහෙයවීම පිළිබඳ රාජකාරි නය, පරිපාලනය, සහ මෙහයවීම පිළිබඳ රාජකාරි අපෙක්ෂකයිනට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය.
(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.
(සී) වෘත්තීය සහ/හෝ තාක්මික සුදුසුකම් පිළිබඳ සහතික.
(ඩී) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන :** (1) කිසිම ලියවිල්ලක් අයදුම්පතට ඇමිණිය යුතු නොවේ.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම්පත් එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම්ට කෙලින්ම දැන්විය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලියකියවිලි නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් නමට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුලත එම අයදුම්පත් ලැබුණ බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලැබුණු විට ඒ බව වහාම නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

ඒ. එම්. එන්. අමරකෝන්,
ලේකම්, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ 1,
චිරාන් ස්වර්ක්ස් මන්දිරය,
නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ දීය.

**සහකාර වැඩ සටහන් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් පෝරමය**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
   (1973 මාර්තු 30 දිනට වයස :— අවු :——, මාස :——, දින :——.)
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
9. දැනට කරන රක්ෂාව :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් :————.
11. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙසින් සහතික කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් හෝ මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට මා බැඳී ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–408/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### බැංකු සේවාවේ IV වන ශ්‍රේණියේ සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුරු

බැංකු සේවාවේ IV වන ශ්‍රේණියේ සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම බැංකුව මගින් සපයනු ලබන ආකෘතිපත්‍ර මගින් ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් එවනු ලබන ලිපි කවරයෙහි වම්පස උඩ කොනෙහි "IV වන ශ්‍රේණියෙහි සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුරු සඳහා" යනු සටහන් කළ යුතුය. ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා සේවක මණ්ඩල දෙපාර්තමේන්තුවට පැමිණීමෙන් හෝ තම ලිපිනය සහිත මුද්දර ගැසූ (4"×9") ලිපි කවරයක් එවීමෙන් හෝ ලබාගත හැක. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 1973. 3. [illegible] වනු ඇත.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට අදාළ මාසික මූලික වැටුප් තලය.

රු. 305—රු. 675
කා.ක. 575
8×15—10×25

3. **තනතුර සඳහා කොන්දේසි.**—

(i) තනතුර ස්ථිරය.

(ii) මෙම පත්වීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් ය.

(iii) තෝරා පත්කර ගන්නා අයදුම්කරු තම මුලු වැටුපෙන් 6% ක් ද, බැංකුව මගින් ඔහුගේ මුලු වැටුපෙන් 9% ක් ද, ගෙවනු ලබන බැංකුවේ සේවාවසාන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳිය යුතුව ඇත.

(iv) තෝරාගන්නා අයදුම්කරු තනතුර භාරගැනීමට පෙර, මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බවට වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුව ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම ඔහුට/ඇයට පහත සඳහන් සුදුසුකම් ඇති බැව් සනාථ කළ යුතුය.

(i) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

(ii) අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය වන විට, වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

(iii) සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි යන විෂයයන් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය හෝ ඒ හා සමාන විභාගයකින් හෝ වෙනත් උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුව ඇත.

(iv) රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක භාෂා පරිවර්තකයෙකු ලෙස අඩුම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබාගන්නා ලද උසස්ම අධ්‍යාපනික සහතික සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) සුදුසුකම්, චරිතය සහ තනතුරට සුදුසු බැව් සඳහන් සහතික.

මේ සම්බන්ධව අයදුම් පත්‍ර සහ ඊට අදාල ලියකියවිලි සියල්ලක්ම කොළඹ 3, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ, සේවක මණ්ඩල නිලධාරී වෙත එවිය යුතුය.

තෝරාගන්නා අයදුම්කරු මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනටමත් පනවා ඇති සහ විටින් විට පනවනු ලබන නීති රීතිවලටද බැඳිය සිටිය යුතුව ඇත.

සාමාන්‍යාධිකාරී.

1973 පෙබරවාරි 26 වන දින,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
කොළඹ 3.

3-390—73,03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

## ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

### විමර්ශන නිලධාරි තනතුරු

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරි තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත්‍ර බාර ගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය ප්‍රකාර විය යුතු අතර, 1973 මාර්තු මස 31 දින හෝ ඊට පෙර කොළඹ 1, චැතැම් වීදියේ අංක 54, තැ. පෙ. 559, ආනයන හා අපනයන පාලක තැන වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ඉල්ලුම් පත්‍ර බහාලූ කවරයේ වම් පස ඉහළ කෙළවරේ "විමර්ශන නිලධාරි තනතුරු" යන්න සඳහන් කළ යුතු ය.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරුවලට අදාළ ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 6,600—180×8 සහ 240×5—රු. 9,240 වේ. වර්ෂයකට රු. 7,000 ට සහ රු. 8,040 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතවි ය. (මෙයට අනුරූපව, 1969.10.01 දිනට පෙර පැවැති වාර්ෂික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,900—180×8 සහ 240×5—රු. 6,540 වේ. වර්ෂයකට රු. 4,800 සහ රු. 5,340 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව ය.)

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—තනතුරු ස්ථිර ය. තෝරාගනු ලබන අපේක්ෂකයන් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරු නොදරත් නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුත්තාහ. තෝරාගනු ලබන අපේක්ෂකයන් පත්වීම් ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරත් නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන් දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නොවූවාහු නම්, පළමුකොට, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කැරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියුක්ත ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාලයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

4. **සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු ම පහත සඳහන් කරුණු සනාථ කැරෙන සතුටුදායක සාධක ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයකින් ද යහපත් ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත බව,

(ආ) 1973 මාර්තු මස 31 දිනට තමාගේ වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව, (දැනට රජයේ සේවයෙහි නියුක්තවූවනට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඉ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලද උපාධියක් ඇති බව හෝ

(ii) වර්ෂයකට රු. 5,304 කට නොඅඩු වැටුපක් ලබන, 10 අවුරුදු සේවා කාලයක් සහිත, සාමාන්‍ය ලිපිකාර සේවයේ I පන්තියේ හෝ II පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරියකු බව හෝ

(iii) රුපියල් 5,304 කට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන, 10 අවුරුද්දකට නොඅඩු සේවා කාලයක් සහිත, වෙනත් කවර හෝ රජයේ දෙපාර්තමේන්තුවක විමර්ශන නිලධාරියකු බව,

(ඊ) යටත් පිරිසෙයින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ලද සාමාර්ථයකට සමාන ඉංග්‍රීසි දැනුමක් ඇති බව.

5. **ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍රවලට පහත දැක්වෙන ලියැවිලි වල පිටපත් ඇමිණිය යුතුය :—**

(අ) ඉහළ 4 (ඉ) ඡේදයේ සඳහන් උපාධි සහතිකය.

(ආ) ඉංග්‍රීසි දැනුම ස්ථුට කැරෙන අධ්‍යාපන සහතිකය.

(ඉ) උප්පැන්න සහතිකය (බවුතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවන්හි ව්‍යවස්ථා සංග්‍රහයේ පරමාර්ථයන් අරබයා නිකුත් කැරුණු උප්පැන්න සහතික පිළිගනු නොලැබේ.)

(ඊ) චරිතය පිළිබඳ ව මෑතක දී ලබාගත් සහතික දෙකක් (දැනට මත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් මෙය අවශ්‍ය නොවේ).

**සංලක්ෂ්‍යය.**—මේ සහතික පිටපත් ඉල්ලුම්කරුවනට ආපසු එවනු නොලැබේ. **මුල් පිටපත් නොඑවිය යුතු ය.**

6. මේ ගැසට් පත්‍රයේ I කොටසේ (II ආ ඡේදයේ) ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කැරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන් සැලකිල්ලෙන් සනිටුහන් කර ගත යුතු ය.

එන්. ඩබ්ලිව්. එච්. ඩී. ගුණරත්න,
ආනයන හා අපනයන පාලක.

1973 ක් වූ පෙබරවාරි මස
කොළඹ 1,
චැතැම් වීදියේ අංක 54,
තැ. පෙ. 559,
ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය

### විමර්ශන නිලධාරි තනතුරු

### ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :———.
(පැහැදිලි අකුරින්)

2. ලියුම් යොමුව : (i) පෞද්ගලික :———.
(ii) රාජකාරි :———.

3. උපන් දිනය :———.
1973 මාර්තු මස 31 දිනට වයස :———.

4. ජාතිය :———.
(අ) පරම්පරාවෙන් නොහොත් ලියාපදිංචියෙන් ලාංකිකයෙකුද යන වග :———.

5. අධ්‍යාපන සුදුසුකම් :———.
(ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සුදුසුකම් ද ඇතුළුවයෙනි)
1. ———.
2. ———.
3. ———.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

6. විවාහක අවිවාහක භාවය :———.

7. දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නම් පහත සඳහන් විස්තර දක්වන්න :—
(i) දැරූ තනතුරුවල ස්වභාවය සහ දිනයන් :———.
(ii) (රජයේ ලිපිකාර සේවයේ නම්, එහි II පංතියේ 'අ' ඛණ්ඩයට සහ/හෝ I පන්තියට උසස් කරනු ලැබූ දිනයන් ආදිය ද සඳහන් කරන්න) :———.
(iii) 1973 මාර්තු මස 31 දිනට වාර්ෂික වැටුප :———.

8. විශේෂ හිමිකම්, සුදුසුකම් සහ පළපුරුද්ද ආදිය පිළිබඳ විස්තර : ———.

9. පහත සඳහන් සහතික පිටපත් අමුණා ඇත :—
(අ) මගේ අධ්‍යාපන සහතික (දැන්වීමේ බී (අ) සහ (ආ) ඡේද බලන්න).
(ආ) උප්පැන්න සහතිකය.
(ඉ) චරිතය පිළිබඳ ව මෑතකදී ලබාගත් සහතික දෙකක්.

මේ ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයා ඇති තොරතුරු සත්‍ය මෙන්ම නිරවද්‍ය බව මෙයින් සහතික කර සිටිමි. ඉදින් මෙහි ඇතුළත් විස්තර කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් තෝරාගනු ලැබීමට පෙර නම් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද, පත් කරනු ලැබීමෙන් පසු ව නම් කිසිම වන්දියකින් තොරව සේවයෙන් පහ කරනු ලැබීමට ඉඩ ඇති බව ද මම දනිමි.

* ඉදින් මම සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ නම්, ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කළ සහතිකය ඉදිරිපත් කරන්නෙමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.
(* පරම්පරාවෙන් ලාංකිකයකු නම් කපා හරින්න.)

3-387—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගුවන් විදුලි සංස්ථාව

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධිකාරි ඉංජිනේරු තනතුරක් සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :
(අ) එම්.අයි.ඊ.ඊ. හෝ ඒ.එම්.අයි.ඊ.ආර්.ඊ. සමග පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක්, සහ
(ආ) විධායක තත්ත්වයේ අඩු වශයෙන් අවුරුදු 5 ක් සහිතව ඉලෙක්ට්‍රොනික් විද්‍යාව/විදුලි සංදේශ විද්‍යාව පිළිබඳ යටත් පිරිසෙයින් 10 වසක පළපුරුද්ද, හෝ
ගුවන් විදුලි ආයතනයක ඉංජිනේරුවරයෙකු වශයෙන් අවුරුදු 5 ක සේවය.

වයස.—අවුරුදු 35 කට නොඅඩු විය යුතුයි.

වැටුප් ක්‍රමය.—රු. 1,250—1,750 (50 × 10) කි. රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1973.03.27 දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " අධිකාරී ඉංජිනේරු තනතුර සඳහා වූ අයදුම්පත " යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඔස්වල්ඩ් තිලකරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

1973 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම්පත

### ලංකා ගුවන් විදුලි සංස්ථාව

........................ තනතුර සඳහා අයදුම්පතයි

1. සම්පූර්ණ නම :———.
(අ) මුල් අකුරු සහිත නම :———.
(මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යන වග සඳහන් කරන්න).

2. පුද්ගලික ලිපිනය :———.

3. උපන් දිනය :———.
1973.03.27 දිනට වයස :— අවු. :——, මාස :——, දින : ———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).

4. ජාතිය :———.

5. අධ්‍යාපන පුහුණුවීම් :—

| අධ්‍යාපනය ලැබූ පාසැල් හා ආයතන | දින සිට දක්වා | සමත්වී ඇති විභාගය | දැරූ වගකිව යුතු තත්ත්ව හා යෙදූ පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | | | |

6. සමත් වී ඇති උසස්ම විභාගය :—
සිංහල :———.
දෙමළ : ———.
ඉංග්‍රීසි :———.

7. කාර්මික/වෘත්තීය සුදුසුකම් :———.

8. පළපුරුද්ද :———.
(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාලක්‍රමානුගතව යොදන්න).

9. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :—
1. ———.
2. ———.
3. ———.

10. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :—.
1. ———.
2. ———.
3. ———.

11. වෙනත් විස්තර :———.

මා ඉහත ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි හා සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහත දෙන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් එම හේතුවෙන් සේවයෙන් පහ කිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදාල වැදගත් කිසියම් කරුණක් පිළිබඳව හෝ හිතා මතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමක් මට එල්ලවන බවත්, මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

3-410—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

## තේ පාලන දෙපාර්තමේන්තුව

### තේ උපදේශක/පරීක්ෂක තනතුරු

තේ පාලන දෙපාර්තමේන්තුවේ තේ උපදේශක/පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර 1973 මාර්තු මස 24 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

**1. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. 1972 ජනවාරි 01 වැනි දිනට ප්‍රථම පත් කරනු ලැබූ සහ 1972 ජනවාරි 01 වැනි දිනදී විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නා වූ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට ඉඩ ඇත.

**2. වැටුප් ක්‍රමය :**

වර්ෂයකට රු. 3,864—144 × 18—රු.6,456 ඒකාබද්ධ වැටුප

**3. අවශ්‍ය සුදුසුකම් :**

සෑම ඉල්ලුම්කරුවෙක් විසින්ම පහත සඳහන් සුදුසුකම් තමන්ට ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතුය :—

(i) තමා පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලාංකික යෙකු බව ;

(ii) 1973 මාර්තු මස 24 වැනි දින වන විට තමාගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය ;

(iii) පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ ගොවිකම් පාසැලේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්වී තිබීම ; හෝ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිත අඩු වශයෙන් අවුරුද්දක තේ වගාව ඇතුළු වෙනත් භෝග වගාවන්ට අදාල ක්ෂෙත්‍ර කටයුතු පිළිබඳ පලපුරුද්දක් තිබීම ; හෝ

(v) අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා විභාගයෙන් සමත් වී තිබීම ; හෝ

(vi) උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හෝ වෙනත් විද්‍යා විෂයයන් තුනකින් එකම විභාගයේදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාර්ථයක් සමග තේ වගාව ඇතුළු වෙනත් භෝග වගාවන්ට අදාල ක්ෂෙත්‍ර කටයුතු පිළිබඳ තුන් අවුරුදු පළපුරුද්දක් තිබීම.

(අධ්‍යාපනික හා/හෝ වයස පිළිබඳ සුදුසුකම් නොසලකා තේ පාලන දෙපාර්තමේන්තුවේ ලිපිකාර සේවයේ II ශ්‍රේණියේ "අ" ඛණ්ඩයට අයත් නිලධාරීහුද මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.)

4. තම රාජකාරි ගමන් සඳහා වාහනයක් නඩත්තු කිරීම තෝරා පත් කර ගන්නා නිලධාරියාගෙන්, අපේක්ෂා කෙරේ.

5. සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම උප්පැන්න සහතික පත්‍රයේත්, අධ්‍යාපනය පිළිබඳ ලබා ඇති උසස්ම සහතික පත්‍රයේත්, ලඟදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකකත් පිටපත් එවිය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ඩී. චංමුගම්,
තේ පාලක.

තේ පාලන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 363, කොළඹ 1,
1973.02.22.

### අයදුම් පතෙහි ආකෘතිය

#### තේ උපදේශක/පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————. 1973 මාර්තු 24 දිනට වයස අවුරුදු :————.
4. විවාහකද අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :
   (i) ගැසට් නිවේදනයේ 3 වන ඡේදය යටතේ අපේක්ෂා කරනු ලබන අධ්‍යාපනික සුදුසුකම් අතුරින් ඔබට ඇති සුදුසුකම් පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් අමුනන්න) :—
   ............................................................
   ............................................................
   ............................................................
   (ii) ඔබ ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් අමුනන්න) :—
   ............................................................
   ............................................................
   ............................................................
   (iii) වෙනත් විශේෂ සුදුසුකම් :—
   ............................................................
   ............................................................
   ............................................................
6. භාෂා දැනුම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) :—

| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|
| (ඒ) හොඳින් කථාකිරීමට දන්නා භාෂා | | | |
| (බී) මනා ලෙස කියවීමට දන්නා භාෂා | | | |
| (සී) හොඳින් ලිවීමට දන්නා භාෂා | | | |

7. පාසැලෙන් අස්වූ පසු නියුක්තවූ සේවයන් සහ එක් එක් තනතුර දැරූ කාල සීමාවන් පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් :—
   ............................................................
   ............................................................
   ............................................................
   ............................................................
8. දැනට ඔබ රක්ෂාවක යෙදී සිටින්නෙහිද ? (ඔව් හෝ නැත) :————.
   ඔබ රක්ෂාවක යෙදී සිටීනම්, පහත සඳහන් විස්තර සපයන්න :—
   (ඒ) සේවය කරන ස්ථානයේ ස්වාමියාගේ නම සහ ලිපිනය :————.
   (බී) රක්ෂාවට පත්වූ දිනය :————.
   (සී) කරන වැඩ පිළිබඳ විස්තර සහ තනතුර :————.
   (ඩී) දැනට ලබන වැටුප (සියළුම දීමනා ඇතුළුව) :————.
9. මෙම ඉල්ලුම් පත්‍රයට අදාල විශේෂ පලපුරුදුකම් හෝ සුදුසුකම් තිබේ නම්, ඒවා ලුහුඬින් සඳහන් කරන්න :—
   ............................................................
   ............................................................
   ............................................................
   ............................................................
10. අමුණා ඇති චරිත සහතික පිටපත් ලබාගත් අයගේ නම් සඳහන් කරන්න :—
   (i) ............................................................
   (ii) ............................................................

ඉහත සඳහන් කරුණු සියල්ලම සෑම අතින්ම නිවැරදි බව මම සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-269—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (ශෂ්‍ය විද්‍යාව) පර්යේෂණ නිලධාරි (නිෂ්පාදන ආර්ථිකය) පර්යේෂණ නිලධාරි (ගොවිපල කළමනාකාරිත්වය) හා පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යාව) තනතුරු

1973 පෙබරවාරි මස 02 වෙනි දින අංක 45 හා 1973 පෙබරවාරි මස 15 වැනි දින අංක 47 දරන ශ්‍රී ලංකා ගැසට් පත්‍ර නිවේදන මගින් ඉල්ලුම් පත් කැඳවන ලද ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත් එවිය යුතු අන්තිම දිනය 1973 මාර්තු 31 වැනි දින තෙක් දීර්ඝ කරනු ලැබේ.

අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තු වන, එම ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ඇතිවන උපාධි අපේක්ෂකයන්ටද මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක. උපාධි ප්‍රතිඵල පිටවූ විගස එම ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ලබා ඇති ඉල්ලුම්කරුවන් ඒ බව ලියා පදිංචි කළ තැපැලෙන් වහාම වැවිලි කර්මාන්ත ලේකම් වෙත දැන්විය යුතුය. එසේ නොකරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

3-235—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**මාතලේ දිස්ත්‍රික්කයේ අඹන් ගඟ කෝරලයේ නාරංගොල්ල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මාතලේ දිස්ත්‍රික්කයේ, පුස්සැල්ල හා නාරංගොල්ල යන ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත වන නාරංගොල්ල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ, හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා මෙහි 3 වෙනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 මාර්තු 31 වැනිදට හෝ ඊට පෙර මාතලේ දිසාපති වෙත එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම් පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම,

(ඇ) ඉල්ලුම්කරුවන් ඉහත 1 වෙනි ඡේදයේ දැක්වෙන ප්‍රදේශයෙහි ස්ථිර පදිංචිකරුවන් වීම,

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංගිරිසි 7 වෙනි ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුසු අය නොවෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛණගත තැපැලෙන් එවිය යුතුවේ.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

1973. 02. 20 වෙනි දින,
මාතලේ, දිසාපති කායර්‍යාලයේ දිය.

මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරලයේ නාරංගොල්ල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගනනා අවසාන දිනට සම්පූර්ණ වයස : :————.
(ආ) උපන් දිනය හා ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම්, එය පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–241/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළේ ඕපල්ගල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මාතලේ දිස්ත්‍රික්කයේ, ආඳාවල හා ඕපල්ගල යන ග්‍රාමසේවක කොට්ඨාශවලින් සමන්විත වන ඕපල්ගල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා මෙහි 3 වෙනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 මාර්තු මස 31 වෙනි දාට හෝ ඊට පෙර, මාතලේ දිසාපති වෙත එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නො අඩු හා 60කට නොවැඩි වීම ;

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම ;

(ඇ) ඉල්ලුම්කරුවන් ඉහත 1 වෙනි ඡේදයේ දැක්වෙන ප්‍රදේශයෙහි ස්ථිර පදිංචිකරුවන් වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 7 වෙනි ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද, මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුසු අය නොවෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛණගත තැපැලෙන් එවිය යුතුයි.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

1973. 02. 20 වෙනි දින,
මාතලේ, දිසාපති කායර්‍යාලයේ දී ය.

මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරළයේ ඕපල්ගල හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය හා ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම්, එය පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10 ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම්, එය පිළිබඳ විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–241/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් 1973. 03. 25 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

**පොත් තබන්නා I වෙනි ශ්‍රේණිය :**

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ;

සහ

ලන්ඩන්හි පොත් තබන්නන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය හෝ පොත් තැබීමේ ඩිප්ලෝමා මධ්‍යම සහතිකය හෝ අයි.සී.ඩබ්.ඒ. 1 වන කොටස හෝ ඒ.සී.සී.ඒ. 1 වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ උසස් වාණිජ සහතිකය ;

සහ

පිළිගත් ආයතනයක පොත් තැබීම පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්ද ;

නැතහොත්

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක්

සහ

ලන්ඩන්හි පොත් තබන්නන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම ;

සහ

පිළිගත් ආයතනයක පොත් තැබීම පිළිබඳව අවුරුදු 7 ක පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය.**—රු. 550—4×25—650 (මසකට සියල්ල අඩංගු).

**පොත් තබන්නා II ශ්‍රේණිය :**

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ;

සහ

ලන්ඩන්හි පොත් තබන්නන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය හෝ පොත් තැබීමේ ඩිප්ලෝමා මධ්‍යම සහතිකය හෝ අයි.සී.ඩබ්.ඒ. 1 වන කොටස හෝ ඒ.සී.සී.ඒ. 1 වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ උසස් වාණිජ සහතිකය ;

සහ

පිළිගත් ආයතනයක පොත් තැබීම පිළිබඳ අවුරුදු 7 ක පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය.**—රු. 450—5 × 20—550—(මසකට සියල්ල අඩංගු).

**පොත් තබන්නා III ශ්‍රේණිය :—**

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සමාන සුදුසුකමක් ;

සහ

ලන්ඩන්හි පොත් තබන්නන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය හෝ පොත් තැබීමේ ඩිප්ලෝමා මධ්‍යම සහතිකය හෝ අයි.සී.ඩබ්.ඒ. 1 වන කොටස හෝ ඒ.සී.සී.ඒ. 1 වන කොටස හෝ ලංකා කාර්මික විද්‍යාලයේ උසස් වාණිජ සහතිකය ;

සහ

පිළිගත් ආයතනයක පොත් තැබීම පිළිබඳව අවුරුදු 4 ක පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය.**—රු. 345—7×15—450—(මසකට සියල්ල අඩංගු).

**සැළකිය යුතුයි.**—අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වන සේ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ භාෂාවක් ඇතුලුව අඩුම වශයෙන් විෂයයන් 6 කින් ලබා ඇති සාමාර්ථය ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හා සමානව සැලකේ.

අයදුම්පත් නියමිත ආකෘති පත්‍රයන්හි වියයුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබාගත හැක. අයදුම්පත් ලේඛනගත තැපැලෙන් කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කවරයේ වම් කෙලවරේ අයදුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුවේ. අයදුම්පත් කිසිවකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල සේවයන්හි නියුක්ත වූවන්ගේ අයදුම්පත් ඔබ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

එස්. බී. සී. හලල්දීන්,
කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2,
1973. 02. 24.

3–339/1—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

තනතුරු ඇබෑර්තු

IV වෙනි ශ්‍රේණියේ වැඩනායක සිවිල්/යාන්ත්‍රික/විදුලි තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් 1973.03.25 වෙනි දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

2. **සුදුසුකම්.**—7 වැනි ප්‍රමාණය සමත්වීම සහ පිළිගත් ඉංජිනේරු හෝ ඉදිකිරීම් ආයතනයක කාර්මික කටයුතු පිළිබඳ අවුරුදු 8 ක් පළපුරුද්දක් තිබිය යුතුය. එයින් අවුරුදු 4 ක් අදාල ශ්‍රේණියේ කාර්මික සුපරීක්ෂක තත්ත්වයේ පළපුරුද්ද විය යුතුය.

3. **වැටුප් ක්‍රමය.**—රු. 280—9×15—415—(මසකට සියල්ල අඩංගු).

4. අයදුම්පත් නියමිත ආකෘති පත්‍රයන්හි වියයුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබා ගත හැක. අයදුම්පත් ලේඛනගත තැපැලෙන් කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කවරයේ වම් කෙලවරේ "IV ශ්‍රේණියේ වැඩ නායක" යන තනතුරු නාමය සඳහන් කළ යුතු වේ. අයදුම්පත් කිසිවකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

5. රජයේ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල සේවයන්හි නියුක්ත වූවන්ගේ අයදුම්පත් ඔබ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

එස්. බී. සී. හලල්දීන්,
කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2,
1973. 02. 26.

3–339/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව**

තනතුරු ඇබෑර්තු

ආරක්ෂක නිලධාරී තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් 1973.03.25 වෙනි දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

2. **සුදුසුකම්.**—

(ඒ) ආරක්ෂක කටයුතු සම්බන්ධ වසර 3 කට නොඅඩු පළපුරුද්දක් ඇති උපාධිධාරීන් විය යුතුය ;

නැත්නම්

(බී) ආරක්ෂක කටයුතු පිළිබඳ වසර 5 කට නොඅඩු පළපුරුද්දක් ඇති අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් 3 කින් සමත් වූ අය විය යුතුය ;

නැත්නම්

(සී) ආරක්ෂක කටයුතු පිළිබඳ වසර 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ පාඨශාලා විභාගය හෝ ඊට සමාන විභාගයක් සමත් අය විය යුතුය.

3. හමුදා සේවාවන්හි කොමිෂන්ලත් නිලධාරීන් හා ගැසට් කරන ලද පොලිස් නිලධාරීන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. **වැටුප් ක්‍රමය.**—රු. 550—25—750 (මසකට සියල්ල අඩංගු).

5. අයදුම්පත් නියමිත ආකෘති පත්‍රයන්හි වියයුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබාගත හැක. අයදුම්පත් **ලේඛනගත තැපෑලෙන්** කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතු අතර, කවරයේ වම් කෙළවරේ "ආරක්ෂක නිලධාරී" යන තනතුරු නාමය සඳහන් කළයුතු වේ. අයදුම්පත් කිසිවකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල සේවයන්හි නියුක්ත වූවන්ගේ අයදුම්පත් ඔබ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

එස්. බී. සී. හලල්දීන්,
කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2, 1973.02.26.

3-339/3—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

## අධිකරණ සේවා උපදේශක මණ්ඩලය

ගම්බද උසාවි සභාපති තනතුර—(උතුරු සහ නැගෙනහිර පලාත්වල)

උතුරු හා නැගෙනහිර පළාත්වල ගම්බද උසාවි සභාපති තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවන ලද අයදුම්පත් 1973 අප්‍රේල් මස 09 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—(i) අයදුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැත් ද යන්න ඉතා පැහැදිලිව සඳහන් කොට, 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ, තම ලිපිනය ලියන ලද්ද වූ ද, මුද්දර නොගැසුවාවූද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. තෝරා ගනු ලැබූ අයදුම්කරු විසින් තම වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර රජය විසින් 9% ක් ඒ සඳහා ගෙවනු ඇත. ස්ථිර පත්වීම අවුරුදු තුනක (3) පරිවාස කාලයකට යටත් වන අතර අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂා විෂයයෙන් සම්මාන සාමර්ථයකට පහළ නොවන තත්ත්වයේ අධ්‍යාපන සුදුසුකමක් නොලබා ඇත්නම් මේ කාලය තුළ සිංහල ප්‍රවීණතා පරීක්ෂනයකින් නිලධාරියා සමත්විය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—තෝරා ගනු ලබන අයදුම්කරුට වැටුප් ගෙවනු ලබන්නේ රු. 360 වාර්ෂික වැටුප් වැඩිවීම් 12 කින් යුත් රු. 8,880 ට හා රු. 9,960 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමන්විතවූ වර්ෂයකට රු. 6,720 කින් පටන් ගෙන වර්ෂයකට රු. 11,040 තෙක් නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මතය.

4. නිවාඩු සහ සෙසු කොන්දේසි අදාල වන්නේ රාජ්‍ය සේවාවට බැඳෙන නවකයන් සම්බන්ධයෙන් වූ රෙගුලාසි අනුවය.

5. මේ තනතුර දැරීමට සෞඛ්‍ය අතින් තමන් යෝග්‍ය බැව් ඔප්පු කිරීමට තෝරා ගනු ලැබූ අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණය කින් සමත්විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක ගම්බද උසාවි සභාපති වශයෙන් සේවය කරනු ලැබීමටද යටත් විය යුතුය.

6. පත්වීම අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබේ.

7. **සුදුසුකම්.**—

(අ) සෑම අයදුම්කරුවෙක්ම, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු හෝ අධිනීතිඥවරයකු විය යුතුය.

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ඇ) මනා දෙමළ දැනීමක් ඇත්තකු විය යුතුය.

(ඈ) වයස අවුරුදු 47 ට නොවැඩි විය යුතුය.

8. පහත සඳහන් ලියකියවිලිවලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටක, ඒවා අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) සිංහල සහ දෙමළ භාෂාවලින් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්, ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් අවසාන දිනට පෙර මා වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

10. ඉල්ලුම් පත්‍ර හා ඒ සම්බන්ධ අනිකුත් ලියකියවිලි යැවිය යුත්තේ අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙතය. ඒවා කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

11. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. කිසියම් අයදුම් කරුවෙකුට ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනෙන් පසු දින 14 ක් ඇතුලත් දී ඉල්ලුම් පත්‍රය ලැබුන බව දන්වා එවනු නොලැබුව හොත් ඔහු විසින්, වහාම මා වෙත ඒ බව දැන්විය යුතුය. මේ අනුව ක්‍රියා කිරීමට අසමත් වීමෙන් අයදුම්කරු පිළිබඳව සලකා බලනු ලැබීම සඳහා ඇති අයිතිය ඔහුට අහිමිවේ.

12. අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අයදුම්කරුවන් එකී පරීක්ෂණයට පැමිණිය යුත්තේ ස්වකීය වියදමිනි.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

1973 පෙබරවාරි මස 21 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 5.

3-364—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය අමාත්‍යාංශය

ක්‍රම සම්පාදන උපදේශක (මුදල්) තනතුර

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ක්‍රම සම්පාදන උපදේශක (මුදල්) තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයෙහි යට දැක්වෙන ආකෘතිය ප්‍රකාර පිළියෙල කරනු ලැබූ ඉල්ලුම් පත් 1973 මාර්තු මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 1, තැ. පෙ. 500, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන.**—

(i) යට දැක්වෙන ආකෘතිය ප්‍රකාර පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පතක් හෝ එය සම්බන්ධයෙන් ලිපියක් හෝ තැපෑලේ දී නැතිවී යයි හෝ ප්‍රමාද වී යයි හෝ යන චෝදනාවක් ගැන සැලකිල්ල දක්වනු නොලැබේ. අවසන් දිනය තෙක් ඉල්ලුම් පත් එවීම පමා කරන අපේක්ෂක යින් ඒ පිළිබඳ වගකීම තමන් විසින්ම භාරගත යුත්තේ ය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි සහ සේවා කොන්දේසි.**—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුයයි නියම කරනු ලැබේ.

**සටහන.**—

71.12.31 දිනට ප්‍රථමයෙන් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් විශ්‍රාම වැටුප් සහිත තත්වය ඔහුට පෞද්ගලිකව තබා ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ii) එක් අවුරුදු කාල සීමාවක් දක්වා පත්වීම වැඩ බලන පදනමකින් තබනු ලැබේ. වැඩ බලන කාලසීමාව තුල කවර

අවසානවකදී හෝ එම කාල සීමාව අවසානයේ හෝ, යථෝක්ත පරිදි තෝරාගනු ලබන නිලධාරියා සිය ස්ථිර තනතුරට ආපසු යවනු ලැබිය හැක.

3. **ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වාර්ෂිකව රු. 17,040—4 × 600—රු. 19,440.

(1969.10.01 දිනට ප්‍රථම අනුරූප වාර්ෂික මූලික වැටුප් ක්‍රමය: රු. 13,800—4 × 600—රු. 16,200).

4. **වයස් සීමාව.**—සෑම අයදුම්කරුවකුම 1973 මාර්තු 20 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

5. **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—

සෑම අයදුම්කරුවකුම—

(i) ශ්‍රී ලංකාවේ හෝ මහා බ්‍රිතාන්‍යයේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වීම ; හෝ

(ii) ශ්‍රී ලංකාවේ හෝ මහා බ්‍රිතාන්‍යයේ පිරිවැය හා කළමනාකාරිත්ව ආයතනයේ සාමාජිකයෙකු වීම ; හෝ

(iii) පිරිවැය හා කළමනාකාරිත්ව ගණකාධිකරණය පිළිබඳ පළපුරුද්ද සහිතව රජයේ ගණකාධිකාරී සේවයේ 2 වැනි පන්තියේ ගණකාධිකාරී වරයෙකු වීම ;

සහ

(අ) ගිණුම් පිළිබඳව විධායක තත්වයක අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම ;

අවශ්‍ය වේ.

**සටහන :**

(i) අපේක්ෂකයාගේ රාජ්‍ය භාෂා දැනුමට විශේෂ සැලකිල්ල දක්වනු ලැබේ.

(ii) ක්‍රම සම්පාදන වැඩ සහ සෞඛ්‍ය මුදල් පාලනය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති අපේක්ෂකයන්ට වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

6. ඉල්ලා එවූ විට සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වූ රෙගුලාසි සංග්‍රහය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය හෝ භාරගනු නොලැබේ) ;

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන කටයුතු භාර අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාල ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය ;

(ඈ) තමන් සතු වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඉ) සිංහලෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සටහන :**

(i) මෙම ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම්පතට අමුණා නොඑවිය යුතුය.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා නොබැලේ.

7. ඉල්ලුම් පත හෝ එයට අදාල වෙනත් යම් ලිපියක් හෝ එවිය යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අමතා මිස මෙම අමාත්‍යාංශයෙහි යම්කිසි නිලධාරියෙකුගේ පුද්ගලික නාමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි කාණ්ඩයේ මුලින්ම පලකොට ඇති රාජ්‍ය සේවාවන්හි තනතුරුවලට කෙරෙන පත්වීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. එල්. විජයපාල,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්.
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ. පෙ. 500,
ගාලුමුවදොර ලේකම් කාර්යාලය,
කොළඹ 1, 1973 පෙබරවාරි මස 28 වන දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

ක්‍රම සම්පාදන උපදේශක (මුදල්) තනතුර — සෞඛ්‍ය අමාත්‍යාංශය

(1) සම්පූර්ණ නම :————.
(අ) පෙලපත් නම :————.
(ආ) අනිකුත් නම් :————.

(2) ලිපිනය :—
(අ) රාජකාරි :————.
(ආ) පුද්ගලික :————.

(3) (අ) 1973 මාර්තු මස 20 වන දිනට සම්පූර්ණ වයස : ————.
(ආ) උපන් දිනය :————.

(4) අධ්‍යාපන සුදුසුකම් :————.

(5) වෘත්තීය සුදුසුකම් සහ ලබා ගත්තා ලද දිනය :————.

(6) දැනට දරන තනතුර :————.

(7) ඉල්ලුම්කරු රජයේ ගණකාධිකාරී සේවයේ නම් :—
පන්තිය සහ පත්වූ දිනය :————.

(8) සිංහල පිළිබඳ දැනුම (අන්තිමට සාමාර්ථය ලත් විභාගය සඳහන් කරන්න) :————.

(9) සලකා බැලීම සඳහා විශේෂ හිමිකම් :————.

(දැන්වීමේ 5 වන ඡේදයේ 2 වන සටහන බලන්න.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

(ඉල්ලුම්කරු රජයේ ගණකාධිකාරී සේවයේ නම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ ප්‍රයෝජනය සඳහා)

3, 6, 7 සහ 8 වැනි ඡේදවල සඳහන් විස්තර නිවැරදිය.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන සහ පදවි නාමය).

දිනය :————.

3–406—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### ජාතික කිරි මණ්ඩලය

#### II වැනි ශ්‍රේණියේ සේවා මණ්ඩල කළමනාකරු තනතුර

කිරි මණ්ඩලීය සේවයේ II වැනි ශ්‍රේණියේ සේවා මණ්ඩල කළමනාකාර තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් පහත සඳහන් ආකාරයට සකස් කර 1973.03.28 දින හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය :—

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,250—50 × 10—රු. 1,750 මසකට ඩියලු දීමනා සමග.

3. **සුදුසුකම්.**—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1973.03.28 වැනි දිනට අවුරුදු 35 ට වැඩි බව.

(ආ) හොඳ කල්ක්‍රියාවෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් හෝ නීතිය පිළිබඳ වෘත්තීය සුදුසුකම් එනම් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයෙකු හෝ නීතිඥයෙකු සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක විධායක තනතුරක සේවා මණ්ඩල කළමනාකාරිත්වය පිළිබඳ අවුරුදු 10 කට නො අඩු පලපුරුද්දක් හෝ එසේ නැතහොත් විධායක තනතුරක සේවා මණ්ඩල කළමනාකාරිත්වය පිළිබඳ අවුරුදු 10 කට නො අඩු පලපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු වීම.

4. **සේවා කොන්දේසි.**—(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම භාර ගැනීමට මත්තෙන් රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය උඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හලහොත් මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48 (අ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කර රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවන නීතිරීති

හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසියකට අයදුම්කරු යටත් විය යුතුය.

(ඇ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු සමග රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

**5. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙකු වේ.

**6. ඇප.**—තෝරා ගනු ලබන අයදුම්කරු ඇප තැබිය යුතුය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගනු ලබන අයදුම්කරු මණ්ඩලයේ වෛද්‍ය නිලධාරි විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**8.** අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය.)

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන්/විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතික.

**9.** අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම සභාපති, ජාතික කිරි මණ්ඩලය, තැ. පෙ. 1155, කොළඹ 5 වෙත හැර මණ්ඩලීය සේවයේ අන් කිසිම නිලධාරියෙකුගේ නාමට නොඑවිය යුතුය

සභාපති,
කිරි මණ්ඩලය

තැ. පෙ. 1155,
ජාතික කිරි මණ්ඩලය,
කොළඹ 5,
1973. 02. 27.

## ඉල්ලුම් පත්‍රය

### II වැනි ශ්‍රේණියේ සේවා මණ්ඩල කළමනාකාර තනතුර

1. සම්පූර්ණ නම :————.

2. පෞද්ගලික ලිපිනය :———— .

3. අයදුම්කරු උපන් දිනය හා උපන් ස්ථානය :- ————.
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :———— .

5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :———— .
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

6. ලබා ඇති උසස්ම වෘත්තීය සුදුසුකම් :————
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. සිංහල හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :———— .

8. කලින් ලබා ඇති පළපුරුද්ද ගැන විස්තර :————
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

| සේවය කළ ආයතනයේ නම | දැරූ තනතුර | සේවා කාලය |
|---|---|---|
| ...................................... | ............... | සිට ...... දක්වා |

9. දැනට කරන රැකියාවේ විස්තර :—

| ආයතනයේ නම | දරන තනතුර | සේවා කාලය |
|---|---|---|
| ...................................... | ............... | සිට ...... දක්වා |

10. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළහැකි දෙදෙනෙකුගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-403—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ වැලිලබඩ පත්තුව සහ කඩවත් සතර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

දෙවුන්දර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය අදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුප කාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 11 වෙනි දිනට හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

ඇන්. වී. කේ. කේ. වේරගොඩ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 පෙබරවාරි මස 24 වෙනි දින,
මාතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

3-405—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### වවුනියා දිස්ත්‍රික්කයේ තිලක්කමූලෙයි උතුර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

වවුනියා දිස්ත්‍රික්කයේ තිලක්කමූලෙයි උතුර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 මාර්තු 24 වැනි දිනට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී තිලක්කමූලෙයි උතුර ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු වීම.

(ඈ) (1) 1925 සිට 1944 දක්වා වූ කාලයේයි දෙමළ පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ, දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(2) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ, ඒ හා සමාන හෝ, එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 පෙබරවාරි මස 24 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

වවුනියා දිස්ත්‍රික්කයේ කිලක්කමුලෙයි උතුර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය පැහැදිලි අකුරෙන්)
(2) ලිපිනය :————.
(3) ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
(4) (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
(5) විවාහක අවිවාහක බව :————.
(6) අධ්‍යාපන සුදුසුකම් :————.
(7) දැනට කරන රක්ෂාව :————.
(8) මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
(9) තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිත :————.
(10) අයදුම්කරු ණය ගැතිව සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
(11) අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද? :————.
(12) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–301—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973 මාර්තු 24 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) අයදුම් පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා 60 ට නො වැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි දෙමළ පාඨශාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ, දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ii) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ, ඒ හා සමාන හෝ, එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති,

1973 පෙබරවාරි මස 24 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

වවුනියා දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙලපත් නාමය පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිත :————.
10. අයදුම්කරු ණය ගැතිව සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–299—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

**මැඩ මූලික (යාන්ත්‍රික වැඩපල) තනතුර**

1. සම්පූර්ණ නම :— (පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

    (1) පුද්ගලික :————.

    (2) කාර්යාලයීය :————.

3. (i) උපන් දිනය. (උප්පැන්න සහතියේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

    (ii) උපන් ස්ථානය :————.

    (iii) 1973.4.9 දිනට වයස :— අවුරුදු :— මාස :—.

4. ජාතිකත්වය :—

    (i) පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග :

    (ii) පරම්පරාවෙන් නම් (අ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :—

    (ආ) පියාගේ පියා උපන් ස්ථානය :—

5. විවාහකද ? අවිවාහකද ? යනවග :————.

6. අධ්‍යාපන සුදුසුකම් :—(සමත් විභාග විෂයයන් සමග යොදන්න. සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

7. කාර්මික හෝ වෘත්තීය සුදුසුකම් : (සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි)

8. ආධුනික, අභ්‍යාස පරිපාටි, පළපුරුද්ද ආදියේ විස්තර :———.

9. පාසැලෙන් අස්වූවාට පසු යෙදුන රක්ෂාවල් සම්බන්ධ විස්තර :————.

10. චරිත සහතික ලබාගෙන ඉදිරිපත් කරන තිදෙනෙකුගේ නම් සහ තනතුරු :————.

11. අනෙකුත් තොරතුරු :————.

මෙම අයදුම් පතේ මවිසින් සඳහන් කර ඇති සියලු විස්තර සැබෑ බවත් නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා නුසුදුස්සෙක් වන බවද තෝරා ගැනීමෙන් පසු යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද මම හොඳාකාර දන්නා බැව් ප්‍රකාශ කරමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–298—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂක සින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 මාර්තු 24 වැනි දිනට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රුපියල් 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

    (අ) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

    (ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

    (ඇ) අයදුම්කරු ඉහත කී නෙඩුන්කේනි ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු වීම.

    (ඈ) (i) 1925 සිට 1944 දක්වා වූ කාලයෙහි දෙමළ පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ, දෙමළ භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ, දෙමළ භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

    (ii) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ, ඒ හා සමාන හෝ, එයට උසස් විභාගය කින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

    (අ) උප්පැන්න සහතිකය.

    (ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

    (ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 පෙබරවාරි මස 24 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**වවුනියා දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

    (පෙළපත් නාමය පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————

4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.

    (ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේ ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිත :————.

10. අයදුම්කරු ණය ගැතිව සිටී ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේ ද ? :————

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

.........................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–300—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඖෂධාගාර පාලක සහ ඖෂධ සම්පාදනය කිරීම පිළිබඳ කථිකාචාර්ය තනතුර**

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ඖෂධාගාර පාලක සහ ඖෂධ සම්පාදනය කිරීම පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර: 1973 මාර්තු මස 30 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර: 1973 අප්‍රේල් මස 7 වැනි දා.

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයැදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරට අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවර යෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වේයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—

(i) මෙම තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගත් අයැදුම්කරුට පෞද්ගලික වෛද්‍ය වෘත්තියේ යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය.—වර්ෂයකට රු. 9,600—360×4 හා 480×5—රු. 13,440 කි. (රුපියල් 11,520 ට පෙර ආයුර්වේද ඖෂධ සම්පාදනය පිළිබඳ අනුමත කරන ලද විෂයයන් පිළිබඳ වූ නිබන්ධය කින් සමන්විත කාර්යක්ෂමතා කඩඉමක් ඇත.)

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973 මාර්තු මස 9 වැනි දිනට වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි බව. (උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන් කෙරේ බල නොපායි.)

(ඇ) i. පිළිගත් ආයුර්වේද විද්‍යාලයක පළමුවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇති බව,

ii. සම්පාදිත ඖෂධ සම්බන්ධ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති බව.

හෝ,

ආයුර්වේද ඖෂධ සම්පාදනය කිරීම පිළිබඳ මූලික පර්යේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තිය ඇති බව,

iii. විශාල වශයෙන් ආයුර්වේද ඖෂධ පිළියෙල කිරීමේ අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්ද.

සටහන.—ඉහත (ඇ) ඡේදයේ සුදුසුකම් නැති වුවද පහත සඳහන් සුදුසුකම් ඇති අයට මෙම තනතුර සඳහා අයදුම් කළ හැකිය. එවැනි අයදුම්පත් සලකා බලන්නේ ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයින් නොසිටියහොත් පමණි.

i. පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක ආයුර්වේද පිළිබඳ ඩිප්ලෝමා උපාධිය සමග ඖෂධවේදී වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් හෝ ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් හා ඖෂධ නිෂ්පාදනය නැත මනා දැනීමක් ලබා තිබීම.

ii. පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.

මෙම සුදුසුකම් අනුව බඳවා ගනු ලබන අපේක්ෂකයාට වර්ෂයකට රු. 6,720—360×12—480×3—රු. 12,480 ඒකාබද්ධ වැටුප් ක්‍රමය අදාල වන අතර, පත්වීමේ දින සිට අවුරුදු 5 ක් ඇතුළත ඉහත 4(ඇ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලබාගත යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන වයස් සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගේ හෝ මහාචාර් වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. එස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 20 දින,
කොළඹ 1,
මහ ලේකම් ගොඩනැගිල්ලේ,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

අංකය :..................................

(කාර්යාලය ප්‍රයෝජනය සඳහා පමණයි)

සෞඛ්‍ය අමාත්‍යාංශය

ඉල්ලුම් පත්‍ර ෆෝර්මය

1. ඉල්ලුම් කරන තනතුර :—

———————————තනතුර

———————————දෙපාර්තමේන්තුව

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත්
එය වහාම දැනුම් දිය යුතුය)

4. උපන් දිනය :————.
වර්ෂය :———— මාසය :———— දිනය :————.

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වනවිට නියම වයස :—
වර්ෂ :————. මාස :————. දින:————.

6. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක් ද එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න.
(සටහන අංක (1) බලන්න)

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :————.
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද ? අවිවාහකද ? වැන්දඹුවෙක්ද, වැන්දඹුවකද යන බව :————.

9. සාමාර්ථ්‍යය ලබා ඇති ඉහළම විභාගය :————.
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

10. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන:—

සාමාන්‍ය අධ්‍යාපනය :————.

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |
| (4) | | |

වෘත්තීය අධ්‍යාපනය :————.

| ආයතනය | සිට | දක්වා |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |
| (4) | | |

11. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

12. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ?

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක්ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

14. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල්:————. (රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න)

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රු. |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |
| (6) | | | |
| (7) | | | |
| (8) | | | |

15. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න)

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන්.—(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඈ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ පදවි නාමය.

දිනය :————

3—367—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව

#### නගර නිර්මාණ සහකාර තනතුරු

නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ නගර නිර්මාණ සහකාර තනතුරු දෙකක්, (2) සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර: 9. 4. 73

(ආ) විදේශියඉල්ලුම් පත්‍ර: 19. 4. 73

**සටහන් :**

(i) ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දවූ ද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන් හි සිටින ශ්‍රී ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුව ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම තුන් අවුරුදු පරිවාස කාලසීමවාකට යටත් වේ.

**සටහන :** 1971. 12. 31 දිනට රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරු නිලධාරියකු නව තනතුරේද එම තත්ත්වයෙහිම තබනු ඇත.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප මෙසේ ය :

වර්ෂයකට රු. 7,800—3×360—රු. 8,880/9,600—4×360 සහ 11×480—රු. 16,320.

වර්ෂයකට රු. 9,600 සහ රු. 13,920 වැටුප් පියවර වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත් අයදුම්කරුවන් රු. 9,960 ආරම්භක වැටුප මත තබනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සෑහෙන දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව;

(ආ) ලන්ඩනයේ රාජකීය නගර නිර්මාණ ආයතනයේ සාමාජිකත්වය තිබෙන බව ;

(ඇ) 1973.3.30 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු

නිලධාරීන් වෙනුවෙන් මෙම වයස් සීමාවන් බලපානු නො ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක නියෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නො ලැබේ.

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතික ;

(ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඈ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය ;

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

සටහන් :

(i) අයදුම්පතට කිසිම ලියකියවිල්ලක් හෝ පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ පිළිබඳ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නාමයට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර සෑම මෙම කාර්යාලයට ලැබුණු බව ඉල්ලුම්කරුවනට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍රය භාර ගන්නා දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධිවිධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවිකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 20 වැනිද,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේදී ය.

3-373—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) තනතුර සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 1973.3.20 දින දී ඉල්ලුම් පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කොට ඇති අයගෙන් විමසන්න. එහෙත් එම විමසීම් කිසිවක් ඔහුගේ පුද්ගලික නාමයට අමතා එවිය යුතු නොවේ.

ඩබ්. ඒ. එල්. විජයපාල,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.
තැ. පෙ. 500, ගාලු මුවදොර,
මහ ලේකම් කාර්යාලයේ පිහිටි,
සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

3-400/1—73 03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) තනතුර සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 1973.3.20 දින දී ඉල්ලුම් පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කොට ඇති අයගෙන් විමසන්න. එහෙත් එම විමසීම් කිසිවක් ඔහුගේ පුද්ගලික නාමයට අමතා එවිය යුතු නොවේ.

ඩබ්. ඒ. එල්. විජයපාල,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

1973.2.28 දින, කොළඹ 1,
තැ. පෙ. 500, ගාලු මුවදොර,
මහ ලේකම් කාර්යාලයේ පිහිටි,
සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

3-400/2—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

### අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ සහ වැවගම්පත්තු කොට්ඨාශයේ සමන්තුරේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධූරය

අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ ප්‍රදේශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන්නාවූ අයදුම්කරුවන්ට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාලය, ග්‍රාමසේවක කායාලය, පළාත් පාලන ආයතන කායාලය, ග්‍රාමීය උසාවි, තැපැල් කායාලය, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ කායාලයන් හි ප්‍රදර්ශනය වන දැන්වීම්වල අඩංගුවේ.

3. සියලුම අයදුම්පත් මෙම කායාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් වියයුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 10 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචිකල තැපැලෙන් එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කායාලය,
අම්පාර, 1973 පෙබරවාරි මස 21 දින.

3-239—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

**අම්පාර දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්දවූර්පත්තු කොට්ඨාශයේ කාරතිවු ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය**

අම්පාර දිස්ත්‍රික්කයේ කාරතිවු ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන්නාවූ අයදුම්කරුවන්ට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ කාර්යාලයන්හි ප්‍රදර්ශනය වන දැනවීම්වල අඩංගුවේ.

3. සියලුම අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්වියයුතු අතර, ඒවා 1973 මාර්තු මස 31 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචිකල තැපෑලෙන් එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර, 1973 පෙබරවාරි මස 13 දින.

3–273—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික ආධුනිකත්ව මණ්ඩලය**

ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ ආධුනිකයන් බඳවා ගැනීම

1973.2.9 දිනැති අංක 45 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පල කරන ලද මාගේ නිවේදනයෙහි දැක්වෙන ඉහත සඳහන් බඳවා ගැනීම් වෙනුවෙන් අයදුම්පත් බාරගන්නා අවසන් දිනය, 1973 මාර්තු මස 15 වන දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ආර්. එල්. බාලසූරිය,
ආධුනිකත්ව අධ්‍යක්ෂ.

ජාතික ආධුනිකත්ව මණ්ඩලය,
30, විජේරාම මවාත,
කොළඹ 7,
1973 පෙබරවාරි මස 26 වැනි දින.

3–441—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා යුද හමුදව—සෙසු නිළ පත්වීම්**

1. ශ්‍රී ලංකා යුද හමුදවේ නිත්‍ය හට සේනාවේ සෙබළුන් වශයෙන් ඉදුරාම බඳවා ගැනීම පිණිස පහත සඳහන් ඇබෑර්තු සඳහා පත්වීම් ඉදිරියෙන් දක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| පත්වීම් | අවශ්‍ය විශේෂ සුදුසුකම් |
|---|---|
| අ. සාමාන්‍ය සෙබල–තූර්ය වාදක, හේවිසි තූර්ය වාදක කණ්ඩායම, ශ්‍රී ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය | (i) පෙරදිග සංගීතය පිළිබඳ ' ගාන්ධර්ව ' මධ්‍යම විභාගය හෝ අ.පො.ස (සා.පෙ.) විභාගයේ සංගීතය විෂයයක් වශයෙන් හෝ සමත්ව සිටිය යුතු වන අතර,<br>(ii) දේශීය බෙර වාදනය ගැන සාමාන්‍ය දැනීමක් සහ දේශීය වන්නම්, ජන ගී යනාදිය ගායනය කිරීමේ හෝ වාදනය කිරීමේ හැකියාවක් තිබිය යුතුය.<br>බටනළා, සිතාර්, වයලීන සහ තබ්ලා යන තූර්ය භාණ්ඩ වැයීමේ හැකියාව සහ බටනළා, සිතාර්, වයලීන, යන භාණ්ඩයන්ගෙන් එකකින්, ඉහත (i) සඳහන් සංගීත සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලබන්නේය.<br>අඩුම අධ්‍යාපන සුදුසුකම් : සිංහල, දෙමළ හෝ ඉංග්‍රිසි අඩු වශයෙන් කනිෂ්ඨය හෝ ඒ සමාන තත්ත්වයේ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතුය. |
| ආ. සාමාන්‍ය සෙබල–තූර්ය වාදක, බටහිර තූර්ය වාදක කණ්ඩායම්, ශ්‍රී ලංකා යුද්ධ හමුද පොදු සේවා බලකාය.<br>ඇ. සාමාන්‍ය සෙබල–නලා කරු/බෙරකරු, බටහිර බෙර සහ නළා වාදක කණ්ඩායම්, 1 ශ්‍රී ලංකා පාබල හමුදව. | (i) ස්වාභාවික, පලුදු නැති අභිමුඛ දත් ද සංගීත භාණ්ඩයකට හුරු කර ගත් අත් හා ඇඟිලි තිබීම, හොඳ ඇස් පෙනුමක්ද, තිබීම.<br>(ii) යෝග්‍යතා පරීක්ෂණයකින් සමත්වීම. (උදාහරණයක් වශයෙන් බුද්ධිය, රිද්මයානුකූලත්වය තහවුරු කර ගැනීම සඳහා) බටහිර සංගීත ප්‍රස්ථාර කියවීමට හෝ<br>පරීක්ෂණයකට භාජනය කරනු ලබන බටහිර සංගීත ප්‍රස්ථාරයන් අනුව, බියුගල්, බටනළා පිඹීමට හෝ අපරදිග බෙර හෝ ප්ලූට් නළා වාදනය කිරීමට හෝ හැකි අය ගැන විශේෂයෙන් සලකනු ලැබේ.<br>අඩුම අධ්‍යාපන සුදුසුකම් : සිංහල, දෙමළ හෝ ඉංග්‍රිසි අඩු වශයෙන් කණිෂ්ඨය හෝ ඒ සමාන තත්ත්වයේ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතුය. |

සටහන.—අයදුම්කරුවන් විසින් තමා අයදුම් කරන වෘත්තීය සහ ඒකකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

2. හුරුකම් හා කාර්යක්ෂමතාවය මැන ගැනීම සඳහා තෝරා ගැනීමට ප්‍රථම අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ඇත.

3. ඉහත පළමුවෙනි ඡේදයේ සඳහන් විශේෂ සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

4. පළමුවෙනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම්වලට අමතර වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදවට ඉදුරාම බැඳෙන සෙබලෙකු ලෙස බැඳීම සඳහා පහත සඳහන් සාමාන්‍ය කොන්දේසි සපුරාලිය යුතුය.

අයදුම්කරුවන්—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු වේ.

(ආ) 1973 අප්‍රේල් මස 09 වෙනි දින වන විට වයස අවුරුදු 18 ට නොඅඩුව ද අවුරුදු 30 ට නොවැඩිව ද සිටිය යුතු වේ.

(ඇ) රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රවීනතාවය පැහැදිලිව දක්විය යුතු වන අතර එය සනාථ කළ යුතුවේ.

(ඈ) උස අඩි 5 යි අඟල් 4 ට අඩු නොවිය යුතු වේ. එහෙත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදධිපතිගේ අනුමැතිය ඇතිව, විශේෂ අවස්ථාවලදී උස අඩි 5 යි අඟල් 4 ට අඩු අය ද බඳවා ගත හැක.

(ඉ) ශ්‍රී ලංකා යුද්ධ හමුදධිපතිගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු වේ.

5. මේ තනතුරු සඳහා ඉදිරිපත් වන සේවා මුක්ත භටයෙක් වේ නම් ඉහත දක්වන ලද සුදුසුකම් වලට අමතර වශයෙන් :

(අ) තමා ශ්‍රී ලංකාරක්ෂක හමුදවේ ඇතුලු බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ යම් හමුදවක අවුරුදු එකකට නොඅඩු කාලයක් සේවය කර ඇති බවට, හා

(ආ) යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී හේවා චරිතය ' ඉතා හොඳ ' යන්නට අඩුවෙන් වර්ග කර නොතිබිය යුතුය.

6. **සේවා කාලය.**—සාමාන්‍යවශයෙන් අවුරුදු 12 ක සේවා කාලය සඳහා බඳවා ගනු ලබන සෙබලෙකු පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවේ ද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදවේ සේවය කිරීමෙන් පසු අස් කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලෙකුට ස්වකීය නිත්‍ය භට හමුදවේ සේවය අවුරුදු 12 දක්වා දීර්ඝ කරනු ලැබීමටත් අවුරුදු 32 ක සේවය සඳහා නැවත බැඳීමටත් ඉඩ දෙනු ලැබේ.

7. **වැටුප් හා දීමනා ප්‍රමාණයන්** —(අ) iii වෙනි ගණය–1, 2 සහ 3 වෙනි තීරුවේ වෘත්තීය නුපුහුණු සහ ' බී ' පන්තියේ 1, 2 සහ 3 වෙනි ශ්‍රේණියේ වෘත්තීය පුහුණු වූවන් ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... | රු. 2880 — 15— 60 × රු. 3780 |
| ලාන්ස් කෝප්‍රල්හෝ සමාන නිලය ... | රු. 3060 — 15— 60 × රු. 3960 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... | රු. 3660 — 15— 72 × රු. 4740 |
| සැරයන් ... | රු. 4620 — 10 — 90 × රු. 5520 |
| මාණ්ඩලික සැරයන් ... | රු. 5010 — 10 — 90 × රු. 5910 |
| බලලත් නිලධාරි II වෙනි පන්තිය ... | රු. 5220 — 10 — 120 × රු. 6420 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් | රු. 5340 — 10 — 120 × රු. 6540 |
| බලලත් නිලධාරි I වෙනි පන්තිය ... | රු. 5640 — 10 — 144 × රු. 7080 |

(ආ) II වෙනි ගණය—වෘත්තීය පුහුණු 'ඒ' පන්තියේ 1, 2 සහ 3 වෙනි ශ්‍රෙණි ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... | රු. 2940 — 15 × 60 — රු. 3840 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය ... | රු. 3120 — 15 × 60 — රු. 4020 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... | රු. 3720 — 15 × 72 — රු. 4800 |
| සැරයන් ... ... | රු. 4800 — 10 × 90 — රු. 5700 |
| මාණ්ඩලික සැරයන් ... | රු. 5250 — 10 × 90 — රු. 6150 |
| බලලත් නිලධාරි II වෙනි පන්තිය ... | රු. 5520 — 10 × 120 — රු. 6720 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් | රු. 5700 — 10 × 120 — රු. 6900 |
| බලලත් නිලධාරි I වෙනි පන්තිය ... | රු. 5940 — 10 × 144 — රු. 7380 |

(ඇ) I වෙනි ගණය—' එක්ස් ' පන්තියේ වෘත්තීය පුහුණු 1, 2 සහ 3 වෙනි ශ්‍රෙණි ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... | රු. 3000 — 15 × 60 — රු. 3900 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය ... | රු. 3240 — 15 × 60 — රු. 4140 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... | රු. 3840 — 15 × 72 — රු. 4920 |
| සැරයන් ... ... | රු. 4920 — 10 × 90 — රු. 5820 |
| මාණ්ඩලික සැරයන් ... | රු. 5340 — 10 × 90 — රු. 6240 |
| බලලත් නිලධාරි II වෙනි පන්තිය ... | රු. 5700 — 10 × 120 — රු. 6900 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් | රු. 5880 — 10 × 120 — රු. 7080 |
| බලලත් නිලධාරි I වෙනි පන්තිය ... | රු. 6120 — 10 × 144 — රු. 7560 |

(ඈ) විවාහක සෙසු නිලයින්ගේ දීමනා—රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට අදල පරිදි එම කොන්දේසි සහ ඒ අන්දමට විවාහක සෙසු නිලයින් වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

(ඉ) රජක දීමනා.—(1) නේවාසිකව වෙසෙන සෙබලෙකුගේ නිල ඇඳුම් හමුද වියදමෙන් පිරිසිදු කරනු ලැබේ.

(2) හමුද නිවාසයෙන් බැහැරව වෙසෙන සෙබලෙකුට ඔහුගේ නිල ඇඳුම් පිරිසිදු කිරීම පිණිස ශ්‍රී ලංකා යුද හමුදාධිපති විසින් නිගමනය කරනු ලබන දීමනාවකට හිමිකරු වෙනු ඇත.

(ඊ) යහපත් හැසිරීමේ දීමනා.—පහත සඳහන් ක්‍රමය අනුව ගෙවනු ලැබේ•

1. 1 වෙනි පදක්කම—අවුරුදු 4 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 25 යි.
2. 2 වෙනි පදක්කම—අවුරුදු 8 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 50 යි.
3. 3 වෙනි පදක්කම—අවුරුදු 12 ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 75 යි.

(උ) දුෂ්කර පළාත්වල සේවය කරන සෙසුනිලයින් සඳහා දීමනා.—

1. නිවිකා රාජකාරි මන්නාරම සහ යාපනය යන පෙදෙස්වල.
2. වලවේ, පදවිය සහ මුතියම්කච්චිකුලම්වල පිහිටි ගොවි ජනපදවල.
3. ශ්‍රී ලංකා යුද හමුදාධිපති විසින් විධානය කරනු ලබන ඉංජිනේරු යෝජනා ක්‍රමවල සේවය කරන සෙසු නිලයින් සඳහා ගෙවනු ලැබේ.

(ඌ) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම.—රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක මුදලක් අඩු කර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳීමේදී සැම සෙබලෙකු විසින් ම දිය යුතුය.

8. මෙම දැන්වීමේ 1 වෙනි ඡේදයේ දැක්වෙන ඉදුරාම බඳවා ගැනීම පිළිබඳ ඇබෑර්තු සඳහා එවනු ලබන ඉල්ලුම් පත් පහත සඳහන් නීතිවලට අනුකූලව එවිය යුතුය.

(අ) ඉල්ලුම් පත් මෙම නිවේදනයේ අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ඉල්ලුම් පත් " ශ්‍රී ලංකා යුද හමුද ආධුනිකයින් බඳවන නිලධාරි, ශ්‍රී ලංකා යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ " යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහි ද, එය බහා ලනු ලබන කවරය මතුපිට ද " ඉල්ලුම් පත්‍ර නිත්‍ය බල සේනා සෙසු නිල පත්වීම් " යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත් 1973 අප්‍රේල් මස 09 වෙනි දින පස්වරු 4.00 පැයට පෙර ඉහත කී ලිපිනයට එවිය යුතුයි.

(ඇ) පත්වීම් එකකට වැඩි ගණනක් සඳහා වුව ද ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැක. එවැනි අවස්ථාවලදී සැම එක පත්වීමක් සඳහා ම වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය.

(ඈ) ඉල්ලුම් පත් වලට පහත සඳහන් සහතික වල පිටපත් පමණක් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියා පදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතිකය ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාර ගනු නොලැබේ).

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(3) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකයක්.

(4) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතකදී ලබා ගත් සහතික තුනක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍ය භට පිළිබඳ සහතික යනාදිය.

(6) එක ඉල්ලුම් පතකට වැඩි ගණනක් එවන විට එවැනි සැම ඉල්ලුම් පතක්ම ඡේද 8 (ඈ) (1), (2), (3), (4) හා (5) හි පරිදි ඉල්ලන ලද සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

සැළකිය යුතුයි.—(1) මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණි.

(2) ඉල්ලුම් පත්‍රය සමග සහතික පත්‍රවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැති වුවහොත් ඊට ශ්‍රී ලංකා යුද හමුද මූලස්ථානය වග කියනු නොලැබේ.

(ඉ) තැපෑලේදී නැති වන ප්‍රමාද වන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවන් ගැන සලකා බලනු නොලැබේ.

(ඊ) ස්වේච්ඡා හමුදවල සාමාජිකයින්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ ඒකක මූලස්ථානය මගින් ඉදිරිපත් කළ යුතුය.

(උ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඌ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත් භාර ගන්නා දිනට පසුව මෙම මූලස්ථානයට ලැබෙන ඉල්ලුම් පත්, භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවට ලැබී, යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

(එ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේම වියදමෙන් පැමිණ පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(ඒ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසු යැයි තෝරා ගන්නා ලද ඉල්ලුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේම වියදමින් කොළඹ දී පෙනී සිටිය යුතුය.

(ඔ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ ශ්‍රී ලංකා යුද හමුද තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණ වලින් පසුව ශ්‍රී ලංකා යුද හමුද නිත්‍ය භට සේනාවට බඳවා ගන්නා අතර ශ්‍රී ලංකා යුද හමුද අභ්‍යාස මධ්‍යස්ථානයෙන් හෝ අන් තැනෙක පවත්වනු ලබන පුහුණුවීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඕ) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයන්ගේ කැමැත්ත පලමුකොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය භට සේනාවට බඳවා ගනු නොලැබේ.

(ක) තෝරා පත් කර ගත් සැම ඉල්ලුම්කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමත් සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූල විය යුතුය.

(ග) ඉල්ලුම්කරු රෙකමදරු කිරීමට කැමති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම් කරු ඒ තනතුරට නුසුදුසු අයෙකු වීමට ඉඩ තිබේ.

(ජ) යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දන ගැනීමට ලැබුනි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
ශ්‍රී ලංකා යුද හමුදාධිපති වෙනුවට.

ශ්‍රී ලංකා යුද හමුද මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

**ශ්‍රී ලංකා යුද හමුද නිත්‍ය භට සේනාවේ සෙසුනිල පත්වීමක් සඳහා වූ ආදර්ශ ආකෘති පත්‍රය**

| අයදුම්කරු ලියාපදිංචි වී ඇති රාජ්‍ය සහා මැතිවරණ කොට්ඨාශය | අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය |
|---|---|
| | |

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————. වයස :————, අවුරුදු :————, මාස :————.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
5. ඉල්ලුම් කරන තනතුර :————.
   (මෙම නිවේදනයේ 1 වෙනි ඡේදයේ දක්වා ඇති පරිදි පත්වීම් සහ ඒකකය සඳහන් කළ යුතුයි)
6. මෙම නිවේදනයේ 1 වෙනි ඡේදයේ දක්වා ඇති පරිදි පත්වීම් සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ඔබට තිබේද ? ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර :————.
7. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටි රක්ෂාව :————
8. උස : අඩි :————, අඟල් :————.
9. ජාතිය :————.
10. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.
11. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.
12. මීට ප්‍රථම යුද, නාවික, ගුවන් හා ස්වේච්ඡා සේවක හමුදවල දැරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දිනය ඇතුලුව සම්පූර්ණ විස්තර :————.
13. වෛද්‍ය පරීක්ෂණයකින් අසමත්වීම නිසා ඔබ ශ්‍රී ලංකා යුද හමුදවට, ශ්‍රී ලංකා නාවික හමුදවට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදවට බඳවා ගැනීම ප්‍රතික්ෂෙප කොට තිබේද ? :————.
14. යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය (සේවා මුක්ත භටයෙක් වේ නම් යුද සේවයෙන් අස්වීමේදී, අස්කිරීමේදී ලබාගත් සහතික පිටපත් ඇමිනිය යුතුයි) :————.
15. වෙනත් සුදුසුකම (ක්‍රීඩා ආදිය) :————.
16. ඉදිරිපත් කරන ලද චරිත සහතික ලබා ගත් අයගේ නම් සහ තනතුරු (මෙම නිවේදනයේ 8 ඡේදයේ (ඇ) (4) බලන්න) :—.
   (1) ————.
   (2) ————.
   (3) ————.
17. ඉල්ලුම්කරු අත්සනින් කර සිටින ප්‍රකාශය : මා විසින් සපයන ලද ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හැටියට සත්‍ය බවට මෙයින් සහතික කරමි:

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–313—73.03.09 දින අංක 50 දරන ගැසට් පත්‍රය

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ අනිකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවැනි භාෂා පිළිබඳ පරීක්ෂණ— 1973 අප්‍රේල්**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ අනිකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවැනි භාෂා පිළිබඳ පරීක්ෂණ, පහත දක්වෙන දිනයන්හි කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1973 අප්‍රේල් 23 — නීතිය (පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම) ... ... පැය 3 යි

1973 අප්‍රේල් 24 — නීතිය (පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ දෙවැනි කාර්යක්ෂමතා කඩඉම) ... ... පැය 3 යි

1973 අප්‍රේල් 24 — නීතිය (අනිකුත් නිලධාරීන් සඳහාය) ... පැය 3 යි

1973 අප්‍රේල් 25 — මූල්‍යක්‍රම /ගිණුම් (පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම) / ගිණුම් (දෙවැනි කාර්යක්ෂමතා කඩඉම) ... පැය 2½ යි

1973 අප්‍රේල් 25 — පරිපාලනය/ආයතන සංග්‍රහය* ... පැය 3 යි

1973 අප්‍රේල් 26 — ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව ... පැය 3 යි

1973 අප්‍රේල් 26 — සිංහල (ලිඛිත) /දෙමළ (ලිඛිත) /ඉංග්‍රීසි (ලිඛිත) ... ....පැය 2 යි

(රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ' නව ප්‍රවේශකයින් ' වශයෙන් සැළකෙන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ සිංහල ප්‍රශ්න පත්‍ර සඳහා කාලය පැය 3 ක වනු ඇත.)

1973 අප්‍රේල් 30 — සිංහල/දෙමළ/ඉංග්‍රීසි (වාචක) පරීක්ෂණ මෙදින ආරම්භ වනු ඇත.

(මෙම කාලසටහන වෙනස් කරනු ලැබිය හැක.)

*" රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා සහ කාර්ය සංවිධාන සංග්‍රහය " යනුවෙන් හෝ " රා.සේ.කො. නියෝග සහ ආයතන සංග්‍රහය " යනුවෙන් කලින් නම් කර තිබූ ප්‍රශ්න පත්‍රය දැන් " ආයතන සංග්‍රහය " යනුවෙන් නම් කර ඇති බව අපේක්ෂකයින් විසින් සටහන් කරගත යුතුය. මේ විෂයය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ පහත දක්වෙන පරිච්ඡේදයන් පිළිබඳ දැනීමක් ඔවුන්ට තිබිය යුතු ය :—

II, III, V, VI ,VII, IX, XVI, XXI, XXIV, XXIX, XXX, XXXIII, XXXV, XXXVI, XXXVIII, XXXIX, XL, XLI, XLIII, XLIV, XLVII සහ XLVIII යන පරිච්ඡේද†.

†ආයතන සංග්‍රහයේ XLVII සහ XLVIII වැනි පරිච්ඡේද තවම මුද්‍රණයකර නොමැති හෙයින්, ඒවායේ ' රෝනියෝ ' කරන ලද පිටපත් කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ, රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ, ආයතන අධ්‍යක්ෂ වෙත ඉල්ලුම් කිරීමෙන් අපේක්ෂකයින්ට ලබා ගැනීමට හැකි වේ.

2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පහත දක්වෙන විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

(අ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (නව නිර්දේශ පත්‍රිකාව
 (i) නීතිය
 (ii) මූල්‍ය ක්‍රම
 (iii) පරිපාලනය
 (iv) ආර්ථික විද්‍යාව† හෝ සමාජ විද්‍යාව†

†(නිලධාරීන්ට ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ ගැනීමට පුළුවන.)

සටහන.—(i) 1971.9.30 වැනි දින පරිපාලන සේවයේ නියුක්තව සිටි එම සේවයේ නිලධාරීන්ට ඉහත (අ) කොටසෙහි දක්වෙන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට හෝ පහත (ආ) කොටසෙහි දක්වෙන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට හෝ සිය අභිමතය පරිදි පෙනී සිටිය හැක.

(ii) මෙම පරීක්ෂණය පාලනය කැරෙන නිර්දේශ පත්‍රිකා සහ අනිකුත් විධිවිධාන අංක 14,996/12 සහ 1972 පෙබරවාරි 9 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 පෙබරවාරි 9 වැනි දින දරණ ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' උපග්‍රන්ථයේ දක්වා ඇත. එතෙකුදු වුවත්, එම නිර්දේශ පත්‍රිකා ' නීතිය ' පිළිබඳ නිර්දේශ පත්‍රිකාවේ ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යන (අ) කොටස යටතේ ලංකා ස්වාධීනතා පනත —1947 (376 වැනි පරිච්ඡේදය) ඉවත් කිරීමෙන් සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්ද, 'පරිපාලනය' පිළිබඳ නිර්දේශ පත්‍රිකාවේ (ආ) කොටසේ ' රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සහ කාර්ය සංවිධාන සංග්‍රහය' වෙනුවට ' ආයතන සංග්‍රහය ' ආදේශ කිරීමෙන්ද වෙනස් වී ඇත. ' පරිපාලනය ' පිළිබඳ ප්‍රශ්න පත්‍රය සඳහා අදළ වන ආයතන සංග්‍රහයේ පරිච්ඡේද මේ නිවේදනයේ 1 වැනි ඡේදයේ දක්වා ඇත.

(ආ) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (පැරණි නිර්දේශ පත්‍රිකාව) :—
 (i) නීතිය,
 (ii) ගිණුම්
 (iii) ආයතන සංග්‍රහය.

සටහන.—(i) 71.9.30 වැනි දින පරිපාලන සේවයේ නියුක්තව සිටියාවූ ද, ඉහත (අ) කොටසෙහි දක්වෙන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට කැමැත්ත නොදක්වන්නාවූ ද, එම සේවයේ නිලධාරීන්ට පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක.

(ii) මෙම පරීක්ෂණය පාලනය කැරෙන නිර්දේශ පත්‍රිකා සහ අනිකුත් විධිවිධාන එවකට වූ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ නිලධාරීන් සහ IV වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සඳහා වූ පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්බන්ධයෙන් 1963 ජූලි 12 වැනි දින අංක 13,697 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාණ්ඩාගාර නිවේදනයේ දක්වුනු නිර්දේශ පත්‍රිකා සහ අනිකුත් විධිවිධානම වේ : එතෙකුදු

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, විදේශ සේවයේ සහ අනිකුත් රාජ්‍ය සේවාවල (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා වූ කාර්‍යක්ෂමතා කඩඉම් විභාගය—1973 අප්‍රේල්**

ඉල්ලුම්පත්‍රය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

කොළඹ 2, මැලේ වීථියේ විභාග කොමසාරිස් වෙත, දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන්, ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම සඳහාය.

විභාගයේ නම කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ දැක්විය යුතුය.

1. (අ) අගට යෙදෙන නම, මුල් අකුරු සමඟ :————.

   (ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :————.

2. උපන් දිනය :————.

3. පදවි නාමය :————.
   දෙපාර්තමේන්තුවේ නම :————.

4. ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවීම සඳහාය) :————.

*5. පරිපාලන සේවයේ නිලධාරියෙකු නම්, නිලධාරියා එම සේවයට පත් කරනු ලැබූ දිනය :————.

*6. පරිපාලන සේවයේ නිලධාරියෙකු නොවේ නම්, නිලධාරියා අයත් සේවය :————.

*7. පරිපාලන සේවයේ නිලධාරියෙකු නම්, නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :————.

* (අදාළ නොවන දෑ කපා හරින්න.)

(අ) පළමුවැනි කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (අ) ;

(ආ) 71.9.30 වැනි දින පරිපාලන සේවයේ නියුක්තව සිටි එම සේවයේ නිලධාරීන් සඳහා වූ පළමුවැනි කාර්‍යක්ෂමතා කඩඉම් විභාගය(ආ)

(ඇ) දෙවෙනි කාර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ;

(ඈ) දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණය.

8. පරිපාලන සේවයේ නිලධාරියෙකු නොවේ නම්, නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :————.

   (අදාළ නොවන දෑ කපා හරින්න.)

   විදේශ සේවය

   (අ) 1 වැනි විභාගය :————.

   (ආ) 2 වැනි විභාගය :————.

   දෙපාර්තමේන්තුමය විභාගය

   දෙපාර්තමේන්තුව :————.

9. ගන්නා විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතුය) :
   (i) ————.
   (ii) ————.
   (iii) ————.
   (iv) ————.
   (v) ————.
   (vi) ————.
   (vii) ————.
   (viii) ————.

10. නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :————.

11. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී ඇත්දැයි සඳහන් කරන්න : එසේ නම්, විෂයයන්ද වර්ෂය හා මාසයද සඳහන් කරන්න :————.

12. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 10 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

*මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර මා විසින් අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද ඒවා බවද ප්‍රකාශ කරමි.

| |
|---|
| මුද්දර කොටුව |

————,
(අපේක්ෂකයාගේ අත්සන)

දිනය :————.

විභාග කොමසාරිස්,
ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, 10 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර/මුද්දරය නිසි පරිදි අලවා අවලංගු කර ඇති බවද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

*ගාස්තුව නොගෙවන විටදී කපාදැමිය හැක.

විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකු හට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම, හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිය යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වා ගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්; රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සමීක්ෂණයට යටත් වන්නේය.

නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාග අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණාවක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගත වන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාගශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය., මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග

අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක නොලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි). විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යානාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත් වංචා සහගත, ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලු ද විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත්, පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි, අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන්පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළ හොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන ද මේ මේ යයි සහතික කිරීමට බැඳි සිටී. මෙ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යටතබා ගත යුතුයලියන ලද කඩදායි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යෑමට කිසි විභාගාපේක්ෂක යකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගා පේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන් ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්නපත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයුම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාග ශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාගශාලාවේ දී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියකවත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන ටැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සයයන විට ගැණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථා වලදී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

3–398—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට අයදුම්පත්‍ර භාර ගැනීම**

1973 අධ්‍යයන වර්ෂය සඳහා ගොඩනැගිලිවල විදුලි උපකරණ සවි කිරීමේ එක් අවුරුදු අර්ධ කාල පාඨමාලාව හැදෑරීම සඳහා අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

**සුදුසුකම් .—**

(අ) **වයස.**—1973 ජනවාරි මස 01 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 17 ට අඩු නොවිය යුතුය.

(ආ) වෘත්තියේ නියුක්ත වූවන්ට පමණක් සීමාවේ.

(ඇ) **අධ්‍යාපන සුදුසුකම්.**—අටවැනි ශ්‍රේණිය හෝ අටවැනි ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතිකය (රජයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම අවශ්‍යතාවය ලිහිල් කරනු ලැබේ.)

3. සතියකට වරක් සෙනසුරාදා සවස් කාලයේ පංති පැවැත් වේ.

4. මෙ ආයතනයට ඇතුල් විය හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

5. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුවම අයදුම් කළ යුතුය. (මුද්‍රිත ෆෝර්ම නිකුත් කරනු නොලැබේ.)

6. 1973 මාර්තු මස 30 වැනි දින නොඉක්මවා ලැබෙන සේ අයදුම්පත්, හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ලේඛකාධිකාරී වෙත එවිය යුතුය.

7. මෙම පාඨමාලාවට මීට කලින් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන්, නැවතත් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

8. විද්‍යාල ගාස්තු වශයෙන් මසකට රුපියල් 5 ක් අයකරනු ලැබේ. මෙය අය කරනු ලබන්නේ නියමිත මාස 9 ට පමණි.

පී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපනය.)

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2,
1973 පෙබරවාරි මස 28 වැනි දී ය.

අයදුම්පත

**අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ අර්ධකාල එක් අවුරුදු ගොඩනැගිලිවල විදුලි උපකරන සවි කිරීමේ පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුළත් වීමේ අයදුම්පත.**

**සැළකිය යුතුයි.**—ඉහත දැක්වෙන දැන්වීමේ පරිදි වයස හා අධ්‍යාපන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කළයුතුයි.

1. සම්පූර්ණ නම :————.
   (පැහැදිලි අකුරෙන්)
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
4. වයස.—1973.01.01 දිනට අවුරුදු :——, මාස :——, දින :——.
5. ජාතිය :————.
6. සමත් වූ උසස් ම විභාගය :————.
7. අධ්‍යාපන සුදුසුකම් ලබා ගත් විද්‍යාලයේ හෝ අනුමත කළ පෞද්ගලික පාසැලේ නම සහ ලිපිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–383—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**නිවේදනය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය—1972

**සංශෝධනය**

1972 දෙසැම්බර් මස 8 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, 1973 ජනවාරි මස 5 වැනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනය මගින් පසුව සංශෝධනය කරනු ලැබූ, පූර්වෝක්ත විභාගය පිළිබඳ නිවේදනය පහත දැක්වෙන අන්දමට තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) **විභාගය පවත්වන දිනය.—'ඒ' කොටස— ඉවත් කිරීමේ** පරීක්ෂණය—මීට පෙර දැනුම් දී ඇති පරිදි 1973 මාර්තු මස 24 වැනි දින නොව, 1973 අප්‍රේල් මස 28 වැනි දින පවත්වනු ලැබේ.

(2) **විභාග පරිපාටිය.**—'ඒ' කොටස—ඉවත් කිරීමේ පරීක්ෂණය පිළිබඳ විභාග පරිපාටිය පහත දැක්වෙන වගන්තිය. **ඉවත් කිරීමෙන්** සංශෝධනය කරනු ලැබේ :—

"තෝරා ගැනීමේ පරීක්ෂණය වන 'බී' කොටසට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම පිණිස අපේක්ෂක/අපේක්ෂිකාවන් 'ඒ' කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් සියයට 50 ක ලකුණු තත්ත්වයක් ලබාගත යුතු වේ."

එම වගන්තිය වෙනුවට පහත දැක්වෙන වගන්තියේ **ආදේශනය** කරනු ලැබේ :—

"එක් එක් විෂයයෙන් ප්‍රමාණවත් ඉහළ මට්ටමක ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂක/අපේක්ෂිකාවන් පමණක් 'බී' කොටස—තෝරා ගැනීමේ පරීක්ෂණයට—පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත. 'බී' කොටසට පෙනී සිටීම සඳහා අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් එක් එක් විෂයයකින් ලබාගත යුතුවූ අවම ලකුණු මට්ටම, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් පමණ සංඛ්‍යාවකට, 'බී' කොටසට පෙනී සිටීමට ඉඩ සළසන්නා වූ ප්‍රතිශතක මට්ටමක් වශයෙන් නියම කරනු ලැබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 27 දා,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

3–399—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මාර්තු | ... | 73.03.02 සිකුරාද | ... | 73.02.21 බදාදා | දවල් 12.00 |
| | | 73.03.09 සිකුරාද | ... | 73.03.28 බදාදා | දවල් 12.00 |
| | | 73.03.16 සිකුරාද | ... | 73.03.07 බදාදා | දවල් 12.00 |
| | | 73.03.23 සිකුරාද | ... | 73.03.14 බදාදා | දවල් 12.00 |
| | | 73.03.30 සිකුරාද | ... | 73.03.21 බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73.04.06 සිකුරාද | ... | 73.03.28 බදාදා | දවල් 12.00 |
| | | 73.04.11 බදාදා | ... | 73.04.04 බදාදා | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්දා | ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. මිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.